# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 26 දරන
# සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මැයි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 35 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 103/80.

## 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1971 අංක 8 දරන පනත මගින් සංශෝධිත, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1958 අංක 15 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "සියයට හයකට" යන වචන වෙනුවට "සියයට අටකට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "සියයට නවයකට" යන වචන වෙනුවට "සියයට දොළහකට" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නියමිත දිනයෙහි දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් අධිභාරයක් ගෙවීමට සේවා යෝජකයන්ට නියම කිරීම.

16. යම් මාසයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවිය යුතු දායක මුදල් ඊළඟ මාසයේ අන්තිම දිනයට පෙර අරමුදලට නොගෙවනු ලැබූ ද, ඒ දායක මුදල් ගෙවීමට අපොහොසත් වූයේ නොවැළැක්විය හැකි හේතු නිසා බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි පැහැදිලි කිරීමට සේවා යෝජකයාට නොහැකි වන්නා වූ ද අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයට අතිරේකව පහත සඳහන් ආකාරයට ගණන් බලනු ලැබූ අධිභාරයක් ඒ මුදල සම්බන්ධයෙන් අරමුදලට ගෙවීමට සේවා යෝජකයා බැඳී සිටිය යුතු ය :—

(අ) දින දහයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහක අධිභාරයක් ;

(ආ) දින දහයකට වැඩි වන නමුත් එක් මාසයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහළොවක අධිභාරයක් ;

2—ඒ 54766—12,000 (81/01)

(ඇ) එක් මාසයකට වැඩි වන නමුත් මාස තුනකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට විස්සක අධිභාරයක් ;

(ඈ) තුන් මාසයකට වැඩි වන නමුත් හය මාසයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට තිහක අධිභාරයක් ;

(ඉ) මාස හයකට වැඩි වන නමුත් මාස දොළහකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට හතලිහක අධිභාරයක් ;

(ඊ) මාස දොළහකට වැඩි කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පනහක අධිභාරයක්.".

අතීතයට බලපාන බව.

4. මේ පනතේ 2 වන සහ 3 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1981 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.